// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2033/49 – 2017 අගෝස්තු 24 වැනි බ්‍රහස්පතින්දා – 2017.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/COM/02/X/2015/52.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. එච්. ජී. මුදිත දිලීප මයා, අංක. 262/1, 8 වෙනි පටුමග, නාගහකොටුව පාර, බැලුම්මහර, ඉඹුල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

1A – G 26141– 07 (2017/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/X/2015/52.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි (අධිකාරය) වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. එච්. ජී. මුදිත දිලීප මයා, අංක. 262/1, 8 වෙනි පටුමග, නාගහකොටුව පාර, බැලුම්මහර, ඉඹුල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක. 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

01. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් සේවය හැර ගියා සේ සලකන ලද ආරක්ෂක නියාමකයින් තිදෙනෙකුගෙන් එක් අයෙකුට හිඟ වැටුප් රහිතව අඛණ්ඩ සේවයද තවත් සේවකයෙකුට හිඟ වැටුප් සහිතව අඛණ්ඩ සේවයද ලබා දී තිබියදී පැමිණිලිකාර ඉල්ලුම්කරුව හිඟ වැටුප් රහිතව නවක සේවකයෙකු ලෙස නැවත බඳවා ගැනීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී ඇත්ද හා එසේ නම් ඔහුට කුමන සහන හිමිවිය යුතුද යන්න හා

02. දෙවනුව 2014 ජනවාරි මස වෛද්‍ය සහතික සමග සේවයට පැමිණ සිටියදී සේවය හැරගියා සේ සැලකීමෙන්, නැවත සේවය ලබා දුන් දින දක්වා වෛද්‍ය සහතික ඉදිරිපත් නොකළා යයි වැටුප් රහිත සේ සැලකීම යුක්ති සහගතද එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන).

2017 ජූලි මස 27 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09-147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.